# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1865/28 - 2014 ජුනි මස 04 වැනි බදාදා - 2014.06.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1)(අ) වැනි අනු ව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2010 නොවැම්බර් මස 22 වැනි දිනැති 1681/3 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2014 ජුනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 ජුනි මස 02 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි අධ්‍යාපන අමාත්‍ය (අංක 37) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 6 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් :-

"7. නොමිලේ පෙළපොත් ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම"

8. පිරිවෙන්වල අධ්‍යාපනයේ යෙදෙන ගිහි හා පැවිදි සිසුන් සඳහා නොමිලේ නිල ඇඳුම් ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම" ;

(2) එම නිවේදනයෙහි අධ්‍යාපන සේවා අමාත්‍ය (අංක 68) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 5 වැනි අයිතමය වෙනුවට පහත අයිතමය ආදේශ කිරීමෙන් :-

"5. නොමිලේ නිල ඇඳුම් (පිරිවෙන්හි හැර) පාවහන්, ඩෙස්කු හා පුටු ආදී උපකරණ හා දිවා ආහාර ආදිය ලබාදීමේ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම" ;

06-540


1A - PG 2069— 150 (2014/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*